(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 45.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 ජනවාරි මස 27 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු අලී සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** නියෝජ්‍ය කථානායකතුමා මතු පළවන නිවේදන කරන ලදී,—

I

"අඹතැන්න, බොල්ලේගොඩ, අංක 1/36 යන ලිපිනයෙහි පදිංචි ජී.ජී.ටී.පී. උදයසිරි මහතාගේ දරුවා ආදි ශිෂ්‍යා ගණය යටතේ කඩඉම් ලකුණු 58ක් ලබා ගත් නමුත් මහ/ධර්මරාජ විද්‍යාලයේ 2015 වසරේදී පළමු වසරට ඇතුළත් කර නොගැනීම සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත කරන ලද පැමිණිල්ල විමර්ශනය කරමින් මෙහිදී පැමිණිලිකරුට අගතියක් සිදුව ඇති බැවින් විදුහල්පතිගේ රාජකාරි බලතලවලට අනුව අගතියට පත් දරුවා පාසලට ඇතුලත් කර ගන්නා ලෙසට ඔහු විසින් කරනු ලැබූ නිර්දේශය විදුහල්පති විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් පසු ප්‍රතික්ෂේප කර ඇති බැවින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) විසින් 1994 අංක 26 දරන පනතින් සංශෝධිත 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 17(3) (ඇ) වගන්තිය යටතේ නිරීක්ෂණය සහ අවධානයටත්, වැඩිදුර කටයුතු සඳහාත් ගරු කථානායකතුමා වෙත වාර්තාවක් එවා ඇති බව දන්වනු කැමැත්තෙමි."

**II**

"ගාල්ල, බෝපේ, නාදුගොඩවත්ත, අංක 118/24 යන ලිපිනයෙහි පදිංචි වයි.එස්.එස්. කොස්තා මහතාගේ දරුවා ගා/රිච්මන්ඩ් විදුහලට ඇතුළත් කර නොගැනීම සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත කරන ලද පැමිණිල්ල විමර්ශනය කරමින් පැමිණිලිකරුගේ දරුවා ගා/රිච්මන්ඩ් විදුහලට ඇතුළත් කර ගන්නා ලෙස ඔහු විසින් කරනු ලැබූ නිර්දේශය ක්‍රියාත්මක නොකර ඇති බැවින් තම නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස ජනාධිපති ලේකම් විසින් අමාත්‍යාංශ ලේකම්වරුන්ට නිකුත් කර ඇති 2014.10.10 දිනැති ලිපිය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යාපන ලේකම්ට දැනුම් දී ඇති බව දන්වමින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) විසින් 1994 අංක 26 දරන පනතින් සංශෝධිත 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 17(3) (ඇ) වගන්තිය යටතේ ගරු කථානායකතුමා වෙත වාර්තාවක් එවා ඇති බව දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම : (**1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්,

(i) 2013/2014 වර්ෂය සඳහා ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව;

(ii) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2013 වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2013 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව

පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තැබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2012/2013 වර්ෂය සඳහා සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2013 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතුයැයි නියෝග කරන ලදී.

(5) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්,

(i) 2013 වර්ෂය සඳහා ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2013 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයේ වාර්ෂික වාර්තාව

පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තැබිය යුතුයැයි නියෝග කරන ලදී.

(6) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(7) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින්, 2009, 2010, 2011, 2012, 2013 සහ 2014 වර්ෂ සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තා පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. පෙත්සම් :**

(1) (i) දොඩන්දූව, පටුවත, කළුවගහවත්ත, අංක 31/5 දරන ස්ථානයෙහි පදිංචි බී. ආර්. එම්. ප්‍රියදර්ශන මහතාගෙන් ලැබුණු 2015.09.23 දිනැති පෙත්සම;

(ii) කහදූව, බෙලිකැටිය, 15 කණුව දරන ස්ථානයෙහි පදිංචි එච්. පී. එස්. කුමාර මහතාගෙන් ලැබුණු 2015.11.05 දිනැති පෙත්සම;

(iii) ඉඳුරුව, අතුරුවැල්ල, සුමතිපාල මාවත, අංක 550 දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. එල්. වී. බණ්ඩාරගේ මහත්මියගෙන් ලැබුණු 2015.11.07 දිනැති පෙත්සම; සහ

(iv) අම්බලන්තොට, මල්පෙත්තාව, රොටවල පාර යන ලිපිනයෙහි පදිංචි සුමිත් දික්කුඹුර මහතාගෙන් ලැබුණු 2015.12.07 දිනැති පෙත්සම

ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) නුගතලාව, රාමලංකාව, "ලක්ෂිත" යන ලිපිනයෙහි පදිංචි ඊ. එම්. අබේරත්න මහතාගෙන් ලැබුණු 2015.11.16 දිනැති පෙත්සම; සහ

(ii) අඹගස්දෝව, හිඹිලියගහමඩිත්ත යන ලිපිනයෙහි පදිංචි එච්. ඒ. පියදාස මහතාගෙන් ලැබුණු 2015.10.13 දිනැති පෙත්සම

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) රාජගිරිය, මැද වැලිකඩ පාර, පළමු පටුමග, අංක 71 දරන ස්ථානයෙහි පදිංචි කේ. සුජාතා රමණී පෙරේරා මෙනවියගෙන් ලැබුණු 2015.12.14 දිනැති පෙත්සම;

(ii) ගම්පහ, විජය පාර, අංක 96/1 දරන ස්ථානයෙහි පදිංචි පද්මා මාලනී මහගමආරච්චි මහත්මියගෙන් ලැබුණු 2015.09.21 දිනැති පෙත්සම; සහ

(iii) යාපනය, ඩේවිඩ් පාර, අංක 71 A දරන ස්ථානයෙහි පදිංචි එස්. ඩී. සිරිල් මහතාගෙන් ලැබුණු 2015.10.29 දිනැති පෙත්සම

ගරු බිමල් රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(4) කොටදෙනියාව, පොල්වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. ඒ. රංජනී කුසුමලතා මහත්මියගෙන් ලැබුණු 2015.12.12 දිනැති පෙත්සම ගරු එඩ්වඩ් ගුණසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) මොනරාගල, කුඹුක්කන, අංක 242 දරන ස්ථානයෙහි පදිංචි එච්. එම්. සුගතපාල මහතාගෙන් ලැබුණු 2015.11.20 දිනැති පෙත්සම ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) මාතලේ, පලාපත්වෙල, කෝන්ගහමුල, අංක 55/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඒ. බී. අළුවිහාරේ මහතාගෙන් ලැබුණු 2015.12.22 දිනැති පෙත්සම;

(ii) මාතලේ, කයිකාවල, කොහිලවත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ. ටී. එම්. සෝමසිරි බණ්ඩා මහතාගෙන් ලැබුණු 2015.11.10 දිනැති පෙත්සම;

(iii) මාතලේ, වෙළන්ගහවත්ත, මඩකුඹුර, "සමිඳු සෙවන" යන ලිපිනයෙහි පදිංචි ආර්. එම්. රණසිංහ බණ්ඩා මහතාගෙන් ලැබුණු 2015.09.28 දිනැති පෙත්සම; සහ

(iv) දඹුල්ල, කුරුණෑගල හංදිය, සිල්වා මාවත, අංක 408/02 දරන ස්ථානයෙහි පදිංචි එස්. සී. එස්. ලියනගේ මහතාගෙන් ලැබුණු 2015.12.11 දිනැති පෙත්සම

ගරු රංජිත් අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(7) කොළඹ 06, ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත, අංක 201/1, 3/2 දරන ස්ථානයෙහි පදිංචි (වෛද්‍ය) කනගසුන්දරම් මනිවන්නන් මහතාගෙන් ලැබුණු 2015.12.10 දිනැති පෙත්සම ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) බුලත්සිංහල, ගුරු ගම්මානය, අංක 452/ජී දරන ස්ථානයෙහි පදිංචි ආරියදාස උඩටියාවල මහතාගෙන් ලැබුණු 2015.10.16 දිනැති පෙත්සම;

(ii) මතුගම හරහා, ඉත්තපාන, මාලබේ යන ලිපිනයෙහි පදිංචි ජී. ඩී. ප්‍රදීප් පුෂ්ප කුමාර මහතාගෙන් ලැබුණු 2015.10.28 දිනැති පෙත්සම;

(iii) බණ්ඩාරගම, කනත්තගොඩ යන ලිපිනයෙහි පදිංචි එච්. ඩී. හෙන්රි ගුණතිලක මහතාගෙන් ලැබුණු 2015.11.02 දිනැති පෙත්සම;

(iv) බුලත්සිංහල, අතුර, ජනහිත පෙදෙස, අංක 154 දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. චන්දන පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු 2015.10.09 දිනැති පෙත්සම;

(v) බුලත්සිංහල, බඹරකුල පෙදෙස යන ලිපිනයෙහි පදිංචි කවීන්ද්‍ර කුලසේන පතිරණ මහතාගෙන් ලැබුණු 2015.10.13 දිනැති පෙත්සම;

(vi) කළුතර, කළුතර දකුණ, ගාලු පාර, අංක 256/6 දරන ස්ථානයෙහි පදිංචි මාලනී ගුණසේකර මහත්මියගෙන් ලැබුණු 2015.10.28 දිනැති පෙත්සම; සහ

(vii) දොඩන්ගොඩ, නැහින්න, "සමන්ති" යන ලිපිනයෙහි පදිංචි එන්. ඒ. වීරසූරිය මහතාගෙන් ලැබුණු 2015.10.12 දිනැති පෙත්සම

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(9) අහුන්ගල්ල, බෝගහපිටිය, අංක 485 දරන ස්ථානයෙහි පදිංචි ජී. ආර්. ශ්‍රීපාල් ද සිල්වා මහතාගෙන් ලැබුණු 2015.12.01 දිනැති පෙත්සම ගරු මනූෂ නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(10) අම්පාර, දුටුගැමුණු මාවත, අංක. 100/02/05 දරන ස්ථානයෙහි පදිංචි ගාමිණී එන්. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු 2015.09.30 දිනැති පෙත්සම ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය විසින් පිළිගන්වන ලදී.

අංක 25 (අ) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"එස්. බී. නාවින්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ශෙහාන් සේමසිංහ මහතා, ගරු ඩී. වී චානක මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**7. අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීම

පනත් කෙටුම්පත, සභාවේ අවසර ඇතිව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**8. දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීම

පනත් කෙටුම්පත, සභාවේ අවසර ඇතිව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**9. රේගු ආඥාපනත යටතේ නියෝගය :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1988 අංක 83 දරන පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10(අ) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 සැප්තැම්බර් 22 දිනැති අංක 1933/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අ. භා. 2.45 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

''ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය''යි කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය යෝජනා කළාය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.30 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

''ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය''යි මුදල් රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.31 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1) :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 සැප්තැම්බර් 17 දිනැති අංක 1932/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2) :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 සැප්තැම්බර් 22 දිනැති අංක 1933/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3) :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ඔක්තෝබර් 01 දිනැති අංක 1934/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4) :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ඔක්තෝබර් 09 දිනැති අංක 1935/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5) :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ඔක්තෝබර් 28 දිනැති අංක 1938/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6) :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. දේශීය ආදායම් පනත යටතේ යෝජනාව :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2016.01.12 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව සහ පෝලන්ත ජනරජ ආණ්ඩුව අතර, 2015 ඔක්තෝබර් මස 6 දින ඇති කරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**17. කල් තැබීම (සමුපකාර සමිති සඳහා නිසි කළමනාකරණ වැඩ පිළිවෙළක්) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 7.15 ට, 2016 ජනවාරි මස 09 වැනි දින සභා සම්මතිය අනුව, 2016 ජනවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.